# අතරමග පාසල් අතහැරයාමට බලපාන සමාජ, ආර්ථික සාධක පිළිබඳ අධ්‍යයනය

ඩී.එම්.ඩී. විරංග[1]

## 1. හැඳින්වීම

"අධ්‍යාපනය යනු බොහෝ විට අනෙක් අය විසින් සකස් කරන ලද යම් සැලැස්මකට අනුව මිනිසුන් තුළ ඉගෙනීම විදහා දැක්වීමට දරණ උත්සාහය" (පාවුලො ෆ්‍රයර්). අධ්‍යාපනයේ මූලික පරමාර්ථය වනුයේ සර්ව සම්පූර්ණ මිනිසෙකු ලෝකයට දායාද කිරීමයි. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබද අන්තර්ජාතික සම්මුතියේ පළමු ව්‍යවස්ථාව අනුව වයස අවුරුදු 18ට අඩු සියළුම මනුෂ්‍යයින් ළමයින් ලෙසට අර්ථ දක්වා ඇත. මෙම වයසේදී ප්‍රථම රාජකාරිය වනුයේ හොඳ අධ්‍යාපනයක් ලැබීමයි. අධ්‍යාපනය ලැබීම සෑම දරුවකුගේම අයිතිවාසිකමක් වේ. ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර 65,612 කි. මෙයින් වර්ග කිලෝමීටර 62,707 භූමිය වන අතර, ජලයෙන් යට වී ඇති ප්‍රමාණය වර්ග කිලෝමීටර 2,905 වේ. ලොව 25වන විශාලතම දූපත වන්නේ ශ්‍රී ලංකාවයි (Calder, 2016). ශ්‍රී ලංකාව තුළ දළ වශයෙන් 21,670,000 ආසන්න ජන සනත්වයක් පවතින අතරම වාර්ෂික ජනගහන වේගය 1.14% වේ. රටේ ජනගහනයෙන් 74.8% බහුතරය සිංහල ජනතාව වේ (Statistics, 2012). ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්තවලට අනුව වර්තමානය වන විට ශ්‍රී ලංකාව පුරා ශිෂ්‍යයන් මිලියන 4.3 පමණ අධ්‍යාපනය හදාරනු ලබයි. ශ්‍රී ලංකාව තුළ සමස්ත පාසල් සංඛ්‍යාව 11,079 වන අතර ඒවායින් 10,394 රජයේ පාසල් වේ. එයින් පාසල් 306 ජාතික පාසල් වේ. පෞද්ගලික පාසල් 77 ද, පිරිවෙන් 560 දක්නට ලැබේ. වෙනත් අනුබද්ධ පාසල් 637 යටතේ මෙරට අධ්‍යාපනය ක්‍රියාත්මක වේ. නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ පාසල් ප්‍රමාණය මෙන්ම සාක්ෂරතා අනුපාතය සැලකිය යුතු ලෙස වැඩි වී ඇත (Statistics, 2018-2019). වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විශාල ගැටළුවක් ලෙස මෙම අතරමග පාසල් අතහැර යාම පෙන්වා දිය හැකිය. මේ පිළිබඳ වර්තමානයේ බොහෝ සෙයින් කතා බහට ලක්වෙන කරුණක් බැවින් මෙයට බලපාන හේතු සාධක පිළිබඳව මෙහිදී අධ්‍යයනය සිදු කර ඇත.

## 2. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත මෙන්ම ද්විතියික දත්ත දෙවර්ගයම පදනම් කරගෙන ඇත. අධ්‍යයනය සඳහා මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිළධාරි කොට්ඨාශ තුනක් මූලික කරගනිමින් ඒවායේ පවතින පාසල්හි පාසල් හැරගිය දරුවන්ගෙන් මෙම නියැදිය තෝරාගෙන ඇත. නියැදියට අනුව පාසල් අතහැර යාම සඳහා බලපාන සාධක අධ්‍යයනය කිරීම සඳහා සාධක විශ්ලේෂණ ශිල්ප ක්‍රමය යොදාගන්නා ලදී. මෙහිදී සමීක්ෂණ දත්තවලට අනුව ආර්ථික ගැටළු, දෙමව්පියන් අහිමි වීම, රැකියාවක් කිරීමේ ආශාව, මව විදේශගත වීම ,දෙමාපිය

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාල
dushanwiranga1996@gmail.com

පෙළඹවීම නොමැති වීම, යහළු මිත්‍රාදීන්ගේ බලපෑම, රෝගාබාධ, ඉගෙන ගැනීමට ඇති දුර්වලතාවය, අඩුවයස් විවාහ, දෙමාපිය අධ්‍යාපනය අඩුවීම යන සාධක මෙම අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත.

### 3. දත්ත විශ්ලේෂණය

සාධක විශ්ලේෂණයේදී KMO පරික්ෂාව හා Bartletts' පරික්ෂාව පිළිබඳ අවධානය යොමු කිරිමේදී මෙමගින් සාධක විශ්ලේෂණය සඳහා යොදාගන්නා දත්තයන්හි වලංගුභාවය පරික්ෂා කරයි. එහිදි KMO අගය මගින් නියැදියේ ප්‍රමාණවත් බවත් Bartletts' පරික්ෂාව මගින් නියැදියේ sphericity පරික්ෂා කරනු ලබයි. KMO අගය 0.5ට වඩා වැඩි විය යුතු බවත් Bartletts' අගයෙහි P අගය 0.05ට වඩා අඩු අගයක් ගත යුතු බව Mohhommed (2018) සඳහන් කර ඇත. මෙම අධ්‍යයනයට අනුව KMO අගය 0.502 වන අතර P අගය 0.000 වන බැවින් මෙම සාධක විශ්ලේෂණය යෝග්‍ය පරික්ෂාවක් වේ. costello and Osborne (2005) සඳහන් කර ඇති ආකාරයට සාධක විශ්ලේෂණයක් සඳහා වඩා පිළිගන්නා සහ ප්‍රචලිත ක්‍රමවේදය වන්නේ සාධක නිස්සාරණ ක්‍රමය සහ Varimax සාධක කැරකැවීමේ ක්‍රමයයි. මෙම අධ්‍යයනය සඳහා මෙම ක්‍රමවේදය යොදාගන්නා ලදි.

වගු අංක 1: විචල්‍යයන්ගේ විචලතාවය (PCF and Varimax)

| component | Intial eigenvalues | | | Extraction sums of squared loadings | | | Rotation sums of squared loading | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | Total | % of variance | Cumulative % | Total | % of variance | Cumulative% | Total | % of variance | Cumulative% |
| 1 | 1.833 | 18.32 | 18.326 | 1.833 | 18.326 | 18.326 | 1.618 | 16.181 | 16.18 |
| 2 | 1.720 | 17.19 | 35.524 | 1.720 | 17.197 | 35.524 | 1.470 | 14.702 | 30.88 |
| 3 | 1.316 | 13.16 | 48.688 | 1.316 | 13.164 | 48.688 | 1.425 | 14.246 | 45.12 |
| 4 | 1.162 | 11.61 | 60.306 | 1.162 | 11.618 | 60.306 | 1.365 | 13.633 | 58.76 |
| 5 | 1.096 | 10.95 | 71.263 | 1.096 | 10.957 | 71.263 | 1.250 | 12.501 | 71.26 |
| 6 | 0.808 | 8.080 | 79.344 | | | | | | |
| 7 | 0.645 | 6.451 | 85.795 | | | | | | |
| 8 | 0.558 | 5.584 | 91.379 | | | | | | |
| 9 | 0.451 | 4.511 | 95.889 | | | | | | |
| 10 | 0.411 | 4.111 | 100.000 | | | | | | |


*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ, 2022*

වගු අංක 1 අනුව පෙනීයන ආකාරයට අයිගන් අගය 1ට වඩා වැඩි සංරචක

පහක් දක්නට ලැබේ. මෙහිදී අයිගන් අගයන් 1 ට වැඩි වීම මත පදනම්ව එම සංරචක පහ ප්‍රධාන සාධක ලෙස ලබාගෙන ඇත. එසේ ලබාගන්නා ලද ප්‍රධාන සාධක මගින් සලකා බලන ලද විචල්‍යයන් 10 හි විචලනයෙන් 71%ක් විස්තර වන බව දැක්විය හැකිය. මෙහිදි සලකා බලන විචල්‍යන් 10 විචලනයෙන් 16.2% ක් පළමු සංරචකය මගින්ද, 14.8%ක් දෙවන සංරචකය මගින්ද, 14.2% තුන්වන සංරචකය මගින් ද, 13.7% හතරවන සංරචකය මගින් මෙන්ම 12.5% පස්වන සංරචකය මගින් ආදි වශයෙන් විස්තර වේ.

එමෙන්ම විශ්ලේෂණය සඳහා තෝරාගන්නා ලද ප්‍රධාන සංරචක ප්‍රමාණය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා Scree plot සටහන භාවිතා කිරීමට හැකියාව පවතියි. එ අනුව ප්‍රස්තාර සටහන 1 ට අනුව එහි පළමු සාධකයේ අගය ඉහළ අගයක් ගනයි. එය ක්‍රම ක්‍රමයෙන් පහළ පහත වැටී ඇති අතර දෙවන සාධකයේ අගය 1.5ට ආසන්නයේ පවතියි. තුන්වන, හතරවන සහ පස්වන සාධකයන්හි අගයන් 1ට ආසන්නව පවතියි. අනෙකුත් අගයන් 1ට පහළ අගයක් ගන්නා බැවින් මහඔය අධ්‍යාපන කොට්ඨාශය තුළ අතරමග පාසල් අධ්‍යාපනය අතහැර දැමීම සඳහා බලපාන ප්‍රධාන සාධක 05ක් බලපා ඇත.

ප්‍රස්තාර සටහන 1: අයිගන් අගයන් සහ සාධක අගයන් (PCF and Varimax)




*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ, 2022*

PCE and Varimax ක්‍රමය අනුව සාධක විශ්ලේෂණය මගින් අතරමග පාසල් ගමන අතහැර දැමීම සදහා බලපෑම් කරනු ලබන ප්‍රධාන සාධක පහක් යටතේ විචල්‍යයන් බෙදා දක්වා ඇත. එහිදි අතරමග අධ්‍යාපනය අතහැර දැමීම සඳහා බලපාන ආර්ථික ගැටළු, මව විදේශගතවීම, දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම අඩු මට්ටමක පැවතීම යනාදි සාධක පළමු සංරචකය සමග දැඩි ලෙස සම්බන්ධ වී ඇත. මෙම සාධක පවුල් පසුබිම මගින් ඇති වූ බලපෑම් හා සම්බන්ධ සාධක හේතුවෙන් එය "පවුල් පසුබිමෙන් ඇතිවන බලපෑම්" ලෙස නම් කර තිබේ. රැකියාවක් කිරීමට ඇති ආශාව දෙවන සංරචකය හා දැඩිව සම්බන්ධ වී ඇත. බොහෝ දරුවන් පිරිසක් රැකියාවක් කිරීමට පෙළඹී ඇත්තේ ඔවුනට මුහුණ පෑමට සිදුවන ආර්ථික ගැටළු පදනම් කරගෙනය. එම නිසා එම සාධකය ආර්ථික

ගැටළු පදනම් කරගෙන ගොඩනැගී ඇති බැවින් එය "ආර්ථික බලපෑම්" ලෙස නම් කර ඇත. එමෙන්ම දෙමව්පිය පෙළඹවීමක් නොමැති වීම, යහළු මිත්‍රාදීන්ගේ අයහපත් පෙලඹවීම යන සාධක තුන්වන සංරචකය සමග දැඩිව සම්බන්ධ වී ඇත. මෙම සාධක ද්විත්වය සමාජයේ පවතින පෙළඹවීමේ තත්වයන් හේතුකොටගෙන සිදුවන බව පැවසිය හැකිය. එබැවින් තුන්වන සංරචකය "සමාජ පෙළඹවීමේ බලපෑම්" ලෙස නම් කළ හැකිය.

වගු අංක 2: PCF and Varimax ක්‍රමය අනුව සංරචක නිර්මාණය කිරිම

| | සංරචක | | | | |
|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 |
| ආර්ථික ගැටළු | .710 | .045 | .024 | -.167 | -.211 |
| දෙමව්පියන් අහිමි වීම | .046 | .141 | -.082 | .051 | .883 |
| රැකියාවක් කිරිමේ ආශාව | .202 | .834 | -.024 | -.044 | .135 |
| මව විදේශගත වීම | .603 | -.502 | .116 | .238 | .209 |
| දෙමව්පිය පෙළඹවීම නොමැතිවීම | .192 | .322 | .756 | -.009 | .121 |
| යහළු මිත්‍රාදීන්ගේ බලපෑම | .085 | .402 | .775 | .090 | -.222 |
| රෝගාබාධ | -.351 | -.315 | .435 | -.115 | .518 |
| ඉගෙනගැනීමට ඇති දුර්වලතාවය | -.124 | .103 | -.071 | .838 | -.070 |
| අඩු වයස් විවාහ | .046 | -.170 | .098 | .742 | .088 |
| දෙමාපිය අධ්‍යාපනය අඩු වීම | .723 | .311 | .165 | -.003 | .135 |

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ, 2022*

එමෙන්ම ඉගෙන ගැනීමට ඇති දුර්වලතාවය, අඩු වයස් විවාහ යන සාධක හතරවන සංරචකය හා බැඳී පවතියි. මෙහිදී මෙයට බැඳී පවතින සාධක ද්විත්වය අධ්‍යාපනික දුර්වලතාවය හේතුවෙන් ඇතිවන තත්වයක් ලෙස පෙන්වා දිය හැකිය. මෙම අධ්‍යයනයේදී පෙනී ගිය කරුණක් වූයේ බොහෝමයක් ගැහැණු දරුවන් අඩු වයසින් විවාහ වී ඇත්තේ අධ්‍යාපනයට පවතින දුර්වලතාවය හේතුවෙන් පාසල් ගමන අතහැර දැමීමෙන් අනතුරුවය. එම නිසාවෙන් හතරවන සංරචකය "අධ්‍යාපනික තත්ව දුර්වලතාවයේ බලපෑම්" ලෙස නම් කළ හැකිය. හදිසි රෝගාබාධ තත්වයන් හදිසියේම දෙමව්පියන් අහිමි වීම වැනි සිදුවීම් ජීවිතයේ මුහුණ දෙන හදිසි මෙන්ම අවිනිශ්චිත තත්වයන්ය. මේ සාධක හේතුවෙන් බොහෝ දරුවන් අතරමග අධ්‍යාපනය අතහැර දැමීම සුලභව සිදුවන්නා වූ කාරණාවකි. එබැවින් මෙම පස්වන සංරචකය " හදිසි තත්වයන්ගෙන් ඇතිවන බලපෑම්" ලෙස අර්ථ දක්වා ඇත.

## 4. සමාලෝචනය

පවුල් පසුබිමෙහි බලපෑම, ආර්ථික බලපෑම, සමාජ බලපෑම, අධ්‍යාපනික තත්වයේ බලපෑම, හදිසි තත්වයන්ගේ ඇතිවන බලපෑම දරුවන් අතරමග පාසල් අතහැර යාම සඳහා බලපාන ප්‍රධාන සාධක වේ. ඒ නිසාවෙන් ශ්‍රී ලංකාව තුළ

දරුවන් අතරමග පාසල් අතහැර යාම අවම කිරීම සඳහා මෙම සාධක කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතුය. එහිදී අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම, පුනරුත්ථාපන වැඩසටහන්, අඩු ආදයම්ලාභි දරුවන්ට සුභසාධන සේවාවන් ක්‍රියාත්මක කිරීම, විෂය මාලා සංවර්ධනය කිරීම වැනි කටයුතු සිදු කළ යුතු බව නිර්දේශ කළ හැකිය.

## References

Department of Statistics. (2018-2019). *EDUCATION.* Retrieved 17th September, 2022 from http://www.statistics.gov.lk/pocket%20book/ chap13. pdf

Department of Statistics. (2012). Retrieved 22nd October, 2022 from http://www.statistics.gov.lk/pophousat/cph2011/pages/activities/reports/cph_2012_5per_rpt.pdf